// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2383/08 - 2024 මැයි මස 06 වැනි සඳුදා - 2024.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* WAB/LND/09/03.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පොදුජන කටයුත්ත කුමක් ද යන වග : වදුරඹ සමෘද්ධි ප්‍රජා මූල බැංකුව පවත්වාගෙන යාම.*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 190 පන්විල ග්‍රාම නිලධාරී වසමේ පිහිටියාවූ ද සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 810457 දරන මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කරන පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල :

ඉඩමේ නම: පන්විල හේන *නොහොත්* හේනකන්ද වත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 2ක් හා වතුර ටැංකියක් ඇත; ප්‍රමාණය: හෙක්: 0.0479.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 ජූලි මස 29 වැනි දින පෙ.ව. 9.30 ට වදුරඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2024 ජූලි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

නිහාරා මෙලනි වෙත්තසිංහ,
ප්‍රාදේශීය ලේකම්,

2024 අප්‍රේල් මස 29 වැනි දින,
වදුරඹ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05-0038

1A - G 041882– 09 (2024/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*